# 65.

# “ප්‍රේමවන්ත දරුවෙනි, ඉදිරිය තවත් භයානකයි. එනිසා හැම දේකදිම සියල්ලන් එකමුතු වෙලා දේව ශුද්ධභාවය අත්දකින්නට සූදානම්ව සිටින්න.”

ජේසු සමිඳුන්ගේ මෙම සුවිශේෂී අනාවරණ රටාව තුළින් අපගේ දේශය පිළිබඳව ජේසු සමිඳුන් දුන් පොරොන්දුවක් 2024 සැප්තැම්බර් 21 ඉටු විය. ඒ සමිඳුන් විසින් තෝරා ගන්නා නව දේශපාලන නායකත්වයක් පිළිබඳවයි. ඒ පිළිබඳව 'ශුද්ධාත්ම පිය සටහන්' 61, 62 පරිච්ඡේදවල සටහන්ව ඇත. දැන් එයින් උපුටා ගත් කොටස් කිපයක් පිළිබඳව අපගේ අවධානය යොමු කරමු.

**2022 අප්‍රේල් 27**

“--- හැම දේශයක්ම මේ මහා පවිත්‍රකරණයට ලක් වෙලා. නමුත් මා කලකට පෙර ප්‍රකාශ කළා, අහෝ ! මේ දේශයට සිදුවන විපතක මහත කියල. අද ඒ විපත් පැමිණෙමින් තිබෙනවා. මා මීට කලින් විශේෂ පණිවුඩ කිපයක් නිකුත් කළානෙ. ඒ පණිවුඩ තුළින් මා විශේෂයෙන් ඇමතුවා දේශය පාලනය කරන රාජ්‍ය නායකයින්ට. ජනතාව උදෙසා ඒ රාජ්‍ය නායකයින් කුමක්ද කළේ, ඒ රාජ්‍ය නායකයින්ව විශ්වාසයට ගෙන ජනතාව ඔවුන් උදෙසා කුමක්ද කළේ කියන දේ ඔවුන්ට හිතන්නට මම ඉඩ හැරියා. ජනතාවට පොරොන්දු දීලා ඒ පොරොන්දු එලෙස ඉටු නොකළොත් ඔවුන්ට කුමක්ද සිදුවන්නේ ? දැන් දෙවි පියාණන් ඔවුන් මුළුමනින් නෙරපා දමන්නට සූදානම්ව සිටිනවා. එනිසා මහා කැළඹීමක් ජනතාව අතර ඇති කරමින් යුක්තිය උදෙසා කතා කරන්නට පියාණන් ඒ හැම දෙනෙක්වම පොළඹවමින් සිටිනවා. මෙය දෙවි පියාණන් විසින්ම ආරම්භ කරන ලද මහා පවිත්‍රකරණයක්. මේ දේශය පවිත්‍ර කරන්නට දේශයේ විනාශයට හේතු වී ඇති සියල්ල වෙනස් විය යුතුයි. එයයි, දැන් සිදුවෙමින් යන්නේ. --- බොහෝ කෙටි කාලයකදී මහා බිහිසුණු තත්ත්වයක් මේ දේශය තුළ හටගන්නවා. එනිසා වැඩි වැඩියෙන් යාච්ඤාවට යොමු වන්න. ගැඹුරු යාච්ඤාවකට දැන් ජනතාව යොමු වෙමින් සිටිනවා. ජනතාවගේ ඒ යාච්ඤාවලට සවන් දෙමින් දෙවි පියාණන්ගේ දයාව දැන් දේශය වෙත යොමුවෙලයි තියෙන්නේ. මහා පවිත්‍රකරණයක් ඉතා වේගයෙන් සිදුකරල ජනතාවට යහපතක් උදා කර දීමයි, දැන් සිදුවෙමින් තියෙන්නේ. විශේෂයෙන් මේ දේශයේ සාධාරණය මම බොහොම ඉක්මනින් ඉටුකරල දෙනවා. මේ වර්ෂයත් මේ ආකාරයෙන් මහා පරීක්ෂණයකට දාලයි තියෙන්නේ. පවිත්‍ර වූ රාජ්‍යයක් පිහිටුවල ඒ හැම දෙයක්ම ඉක්මනින් මම සිදුකරනවා. එතකොට ඔයාලගෙ දූ දරුවන්ගෙ කටයුතු සිදුකර ගන්න පුළුවන්.”

**2022 මැයි 19**

“මේ දේශය ගැන දෙවි පියාණන් බොහෝ සේ බලා සිටියා, දේශ වාසී ජනතාව දෙස බලා සිටියා. මැවීමේ ප්‍රධානම දේ තමයි මනුෂ්‍යයා. මනුෂ්‍යයා අත්දකින මේ මහා පීඩනය ප්‍රෝඩාවන් නිසා මනුෂ්‍යයා බොහෝ සේ වේදනා විඳින ආකාරය දෙස පියාණන් ඉතා වේදනාවෙන් බලා සිටිනවා. ජනතාව පාලකයන් තෝරා ගන්නවා. ඔවුන් දුන් පොරොන්දු ඔවුන් ඉටුකරයි කියල ජනතාව බලාපොරොත්තු වෙනවා. එහෙත් ඒ පාලකයන් ජනතාවගේ මාර්ගයෙන් ඉස්සරහට ගියා මිසක් තමන් උදෙසා යමක් කර ගත්තා මිසක් ජනතාව ගැන බැලුවෙ නැහැ. ඔවුන් ජනතාව තලාපෙලා දාන්න පටන් ගත්තා. පියාණන් දැන් මහා බිහිසුණු තත්ත්වයක් ඇති කරල මුළු දේශයම පවිත්‍ර කිරීම ආරම්භ කළා. එක් කෙනෙක් දෙන්නෙක්ව නොවෙයි, පාර්ලිමේන්තුවට අයිති සියල්ලන් එයින් එළියට දාන තුරුම පියාණන් මේ කාර්යය කරගෙන යනවා. --- මේ අරගලය මෙතැනින් නිමා වන්නෙ නැහැ රටේ නායකත්වය සඳහා දෙවි පියාණන්ට සුදුසු කෙනා ඉස්මතු වන තුරුම මේ අරගලය මේ අය ඉදිරියටම ගෙන යනවා. --- භීෂණය බොරුව හොරකම නිසා දැන් ලෝකයම හෙලා දකින තැනට මේ දේශය පත්වෙලා. මේ දේශයේ නායකයින් ගැන දැනටමත් ලෝකයේ බොහෝ අය දැනගෙන ඉවරයි. ඉතින් ඒ නිසා තව දුරටත් බොරුවට ඉඩ නැහැ. --- එසේම සමිඳාණන් වහන්සේ ඉදිරියේ බලගතුව මොරගසන්න, දේශය ඔසවන ජනතාවට සෙත සලසන කෙනාව ඔවුන් අතර තබමින් තෝරා ගනිමින් ස්ථිර කරන්න කියල.”

**2022 ජුලි 23**

"--- සියලු රාජ්‍ය නායකයිනි, ධනය, නිලය, බලය ආත්මාර්ථය ආභරණයක් කර ගත් ඔබට වන විපතක මහත. --- දේශයේ සතුට සැනසුම පහව ගොස් ඇත. එය නැවත ඇති කර ගැනීමට බොහෝ සේ සටන් කළ යුතුය. පොළොව පාපයෙන් බර වී ඇත. පොළොව කම්පා වී දෙදරා සුනු විසුනු වන්නට තරම් පාපයේ බර අධික වී ඇත. පාපයේ බර කොතෙක්දයත් ඉහළ අහසේ බල මණ්ඩල පහළ පොළොවේ සිටින පාලකයින්ට දඬුවම් කරන කාලය පැමිණ ඇත. දෙවියන් වහන්සේගේ ඉවසීමට සීමාවක් ඇත්තේය. දෙවියන් වහන්සේ ප්‍රේමය මෙන්ම උදහස ද වන සේක. දෙව් පියාණන්ගේ බැල්ම මේ දේශය වෙත යොමුව ඇත. අනාදියේ ආදම් සහ ඒව පිළිබඳ සැලසුම් ආරම්භ වූයේ ද මේ දේශයෙනි. අධර්මිෂ්ඨ බලපෑම් නිසා දූෂ්‍ය වී ඇති මේ දේශය පවිත්‍ර කිරීමේ වගකීම ද දෙවියන් වහන්සේට පැවරී ඇත. එය දෙවියන් වහන්සේ සතු කාර්යයකි ඒ සඳහා උන්වහන්සේගේ වැඩ ඇරඹීමේ කාලයයි, දැන් පැමිණ ඇත්තේ. --- සැබෑ ධර්මිෂ්ඨ රාජ්‍ය ගොඩනැගෙන තෙක් අපි සටන් වදිමු. එය ඉතා ඉක්මනින් ජයග්‍රහණය කරා එළඹෙනු ඇත. එලෙස නව රාජ්‍යයක් පිහිටුවනු ලබයි. මේ දේශයෙන් මුළු ලෝකයටම පණිවුඩයක් දෙමු. ලෝ වැසි සියලු රාජ්‍ය නායකයින්ට මෙය මරු පහරක් වනු ඇත. ලෝ වැසි සියල්ලන් මහත් ගෞරවයෙන් යුතුව මේ දෙස බලනු ඇත. ලෝකයට ආලෝකයක් වන්නා වූ මේ පුංචි දේශය ගැන ලෝක වාසින් යම් දිනෙක කතා කරනු ඇත." (ශුද්ධාත්ම පිය සටහන් 61 පරිච්ඡේදය)

'ශුද්ධාත්ම පිය සටහන්' 62 පරිච්ඡේදයේ මෙලෙස සටහන්ව ඇත. එය 2022 මැයි 19 ජේසු සමිඳුන් දුන් පණිවුඩය හා සම්බන්ධයි. "ඉදිරිය මීට ද වඩා තත්ත්වය බිහිසුණු වෙනවා. ජනතාවට බොහෝ පීඩා විඳින්නට සිදු වෙනවා. ඒ සියලු පීඩා තාවකාලිකව හෝ නිමා වෙමින් ඊළඟට උදා වන්නේ ප්‍රීතිමත් කාලයක්, සශ්‍රීක කාලයක් "(ජේසු එය දැහැමි යුගයේ උදාව ද, ඊට පෙර සිදු වන දෙයක්ද? මම ජේසු සමිඳුන්ගෙන් එලෙස විමසීමි.)" එය ඊට පෙර සිදු වන දෙයක්. සියල්ලන් වින්ද පීඩනයට හරි යන්න ප්‍රීතිමත් කාලයක් දෙනවා. එයින් කලකට පසු තව තවත් දේ සිද්ධ වෙන්න තියෙනවා." මේ දේශයට සශ්‍රීක වසර කීපයක් ලැබෙන බව එයින් කලකට පසු තව තවත් දේවල් සිද්ධ වෙන්න තිබෙන බවයි, ජේසු සමිඳුන් පවසන්නේ. ඒ තමයි මේ දේශය තුළ ස්ථානගත වන ධර්ම අධර්ම මහා යුද්ධය. මැවුම්කරුවාණන් වහන්සේ විසින් මේ දේශය උදෙසා තෝරා ගත් දැහැමි නායකත්වය මගින් සිදු වූයේ යුගාන්තය ආසන්නයේ සිදු වීමට නියමිතව තිබූ සැබෑ මානව වටිනාකම් පිළිබඳ මහා පෙරළියට මුල පිරීමයි මරියාවන්ගේ උදාන ගීතයෙන් ඒ මහා දේව පොරොන්දුව නික්මේ.

"උන්වහන්සේ බැහැපත් වුවන් උසස් කළ සේක.
උඩඟු සිතැති සියලු දෙනා සිය සිතුවිලි සමග විසිර වූ සේක.
බලවතුන් සිය සිහසුන්වලින් පහත හෙළා
පහත් වූ අය උසස් කළ සේක.
සාගින්නෙන් පෙළෙන්නන් හොඳ දෙයින් පෝෂණය කළ සේක.
ධනවතුන් හිස් අතින් යාමට සැලසූ සේක." ලූක් 1: 46-55

අපගේ දේශයෙන් ක්‍රියාත්මක වීමට මුල පිරූ ඒ අධ්‍යාත්මික පෙරළිය ඒ සේවක නායකත්වය ලොව පුරා ව්‍යාප්ත වනු ඇත. ධනය, බලය, ජනප්‍රියත්වය (මැමෝනා) එකම අරමුණ කර ගත් දේශයේ හා ලෝකයේ සියල්ලන් මේ උතුම් වෙනසට එරෙහිව ඒකරාශි වනු ඇත. එය ධර්ම අධර්ම මහා යුද්ධයක ස්වරූපය ගනු ඇත. සාතන්ගේ ආත්මානුභාවයෙන් පැමිණෙන අන්ත ක්‍රිස්තු (Anti Christ) එයට නායකත්වය දෙනු ඇත. ඒ මහා ධර්ම අධර්ම යුද්ධය අප දේශය තුළ ස්ථානගත වනු ඇත. ඒ අරගලයෙන් ද අධර්ම බලවේග අන්ත පරාජයට පත් වනු ඇත. "මේ දේශය උදෙසා තෝරා ගන්නා නව දැහැමි නායකත්වය අධර්මාධිපතිගේ ඉදිරි ක්‍රියාකාරීත්වයට අප දේශය තුළ කිසිසේත් ඉඩ නොදෙන නායකත්වයක් වේවා ! යි අපි පතමු." යනුවෙන් 2022 වසරේ දී 'ශුද්ධාත්ම පිය සටහන්' 62 පරිච්ඡේදයේ මම සටහන් කළෙමි.

'ශුද්ධාත්ම පිය සටහන්' 61 පරිච්ඡේදයේ අරගලය ගැන ජේසු සමිඳුන් පවසන කරුණු 2022 අප්‍රේල් 9 - ජුලි 9 සිදු වූ අරගලයට සීමා වී නැත. එහි සඳහන් බොහෝ කරුණු අදාළ වන්නේ ඉදිරියේ සිදු වන මහා අරගලයටයි. 2022 අප්‍රේල් 9 - ජුලි 9 අරගලය කිසිවකුට අවතක්සේරු කළ නොහැකිය. අප්‍රේල් 9 - මැයි 9 'ආදරයේ අරගලය' උතුම් වෙනසක් පතන සියල්ලන්ගේ ඇගැයීමට ලක් විය. එය මනුෂ්‍ය අතින් පමණක් නිර්මාණය වුවක් නොවීය. එය දේව හස්තය මනුෂ්‍යයා මෙවලම් කර ගනිමින් සිදු කළ දැහැමි යුගයේ උදාවේ පෙරහුරුවක් විය. ජුලි 9 දක්වා ඒ අරගලය නිසා ලැබුණ ජයග්‍රහණයන් රැසකි. ඒ අරගල භූමියෙන් නික්මුණ 'සිස්ටම් චේන්ජ්' සංකල්පය අති විශිෂ්ඨය. ඉදිරියේ අප දේශය තුළ එය ප්‍රායෝගික වනු ඇත.

'ශුද්ධාත්ම පිය සටහන්' 64 පරිච්ඡේදයේ මා සටහන් කළ කරුණක් ඔබ සියල්ලන්ගේ දැන ගැනීම සඳහා මම නැවත මෙහි සටහන් කරමි. අප දේශය පිළිබඳ මැවුම්කරුවාණන් වහන්සේගේ සැලැස්ම මෙයයි.

1. මේ දේශයයි, ආදම් සහ ඒව සිටි සුගති උද්‍යානය, පාරාදීසය.
   (එය 'ශුද්ධාත්ම පිය සටහන්' 44 පරිච්ඡේදයේ මෙලෙස සටහන්ව ඇත.)

"නුඹලා ජීවත් වන මේ දේශයයි, එදා මා මැවූ සුගති උද්‍යානය, ආදම් සහ ඒව සිටි සුගති උද්‍යානය. මුලින්ම මේ දේශයට 'ආදම් උයන' 'පාරාදීසය' යනුවෙන් හැඳින්වූ තැනැත්තා එසේ කළේ දේව අනාවරණයකින්. (ඒ තැනැත්තා කවුදැයි අපි විමසුවා.) එය පොත පතින් දැන ගන්න. නුඹලාගේ ජාතික ගීතයේ උද්‍යානයක සෞන්දර්යය ද ඇතුලත්ව තිබීම ගැන මා සතුටු වෙනවා.")

2. පසු කාලීනව මෙය ධර්ම ද්වීපය විය.
3. මෑත කාලීනව එය මුළුමනින්ම කලියුගයක දේශය විය.
4. කලියුගයේ ස්වභාවය කෙමෙන් නිමා වෙමින් මෙය ලෝකයටම ගැළවීමේ දේශය වනු ඇත.

**2024 ජුනි 05 අපගේ ශුද්ධාත්ම මංගල යැදුමේදී**

"මා ප්‍රේමවන්ත දරුවෙනි, ශුද්ධාත්මයේ මහා වරප්‍රසාදය තුළයි ඔබ හැම පෝෂණය ලබන්නේ. ඒ මහා අනුග්‍රහය ඔබ වටා ඔබගේ ආත්මය වටා දිනා ගනිමින් පෝෂණය වන්නට ශුද්ධාත්මයාණන්ට ආරාධනා කරන්න, බොහෝ පිපාසිතව. ඒ තමා දිව්‍යමය මහා වරප්‍රසාදය. ජීවනයේ උල්පතින් මා ඔබව නාවනු ලබනවා. ඒ ශුද්ධාත්මයාණන්ගෙන්. මුළු මිනිස් සංහතියම ශුද්ධාත්ම වරමින් පූර්ණත්වය කරා ගෙන යනු ලැබීමයි, මගේ පැතුම. අද ලෝකයේ පවතින මේ මහා ව්‍යසනය තුළ අද මනුෂ්‍යයාට දැනෙන්නෙ නැහැ ශුද්ධාත්මයාණන් තමා තුළට පැමිණ තිබෙන බව. මේ මහා ව්‍යසනය තුළ අද මනුෂ්‍යයාට දෙවියෝ ඉන්නවද කියන එකත් ගැටළුවක් වෙමින් තිබෙනවා.

දෙවියන් අදහනව කියන අයටත් දෙවියන් වෙනුවෙන් කාලයක් වෙන් කර ගන්න අපහසු වෙමින් තිබෙනවා. ඒ තරම් තරඟකාරී ලෝකයකයි අද මනුෂ්‍යයා ජීවත් වන්නේ. මා ප්‍රේමවන්ත දරුවෙනි, ඒ ගැන අද මනුෂ්‍යයාට දොස් කියන්නත් අපහසුයි. ඒ ඇයි ? මනුෂ්‍යයාට බාර දුන්න කුරුසිය, තම කර මත තබා ගත්ත ඒ කුරුසිය වැටි වැටී නැගිටිමින් ගෙන යමින් සිටින නිසා. අද පවුල් ජීවිතය කියන්නෙත් මහා කුරුසියක්. කුරුසියේ ගමන් මඟ තමයි, මගේ ජනතාව මා ගෙන යමින් සිටින්නේ.

අද සභාව මනුෂ්‍යයාට කියල දීල නැතිම දේ තමා දිව්‍ය පූජාවට යන්නට කලින් ඊට පෙර සූදානමක් අවශ්‍ය බව. අද මා නුඹලාට දෙන විශේෂ පණිවුඩය එයයි. සභා නීති රාමුවට කොටු වෙලා අද බොහෝ දෙනා දිව්‍ය පූජාවට යනවා. දරුවෙනි දිව්‍ය පූජාව කියන්නෙ ගැඹුරු උත්තරීතර දෙයක්, විශාල ජනතාවක් අධ්‍යාත්මිකව පෝෂණය කළ හැකි දෙයක්. එතැන තමයි තියෙන්නේ උතුම් වූ පෝෂණ කොටස්. දිව්‍ය පූජාව තුළ ස්වාමීන් වහන්සේ ඔබගේ ආහාරය වෙනවා. ඒ සඳහා අද මනුෂ්‍යයාට පෙර සූදානමක් නැහැ, යා යුතු නිසා යනවා. දිව්‍ය පූජාව තුළ එකිනෙකාගෙ සිතුවිලි එහෙ මෙහෙ දුවන අයුරු ඒ තුළ ඔවුන්ගේ ක්‍රියාවන් හැසිරීම් ඒ සියල්ල මට මහත් වේදනාවක්. මක්නිසාද දේවස්ථානයෙන් පිට වන කල වැඩිම දෙනා විවේචනයෙන් යුතුවයි එතැනින් පිට වන්නේ, අනෙකාගේ අඩුපාඩු දුර්වලකම් ගැනයි සාකච්ඡා කරන්නේ. සභාවෙ අඩුවක් පූජකවරයාගේ අඩුපාඩුවක් ගැන හෝ කතා කරනවා. එය නොවෙයි, සිදුවිය යුත්තේ. දැන් ස්වාමීන් වහන්සේ සක්‍රමේන්තු ආකාරයෙන් මා තුළ වැඩසිටිනවා. අනේ ! මගෙ ජේසු, ජේසු ඔයා මා තුළට ආවා මගෙ ආහාරය වෙමින් මා තුළට ආවා. ස්තූතියි, ජේසු. ඔයාව මා ළඟම තබා ගන්නට මා කොයි තරම් ආසද? ඔයා සමග ආදරණීය සංවාදයකින් යුතුව නිවෙසට යන්නට නිවෙසට ගොස් මා කළ යුතු වැඩ කටයුතු අතර ද ඒ සංවාදය තුළම පැයක් දෙකක් ඉන්නට මම කොයි තරම් සතුටුද? ජේසු මට ඒ සඳහා සහාය වන්න. අද බොහෝ දෙනෙකුට එවැනි ආශාවක් එන්නෙ නැහැ. මම ජේසුව ලබා ගත්තයි කියලා කියනවා, නමුත් ජේසුට දිය යුතු මූලික තැන දෙන්නෙ නැහැ. අනෙකා විවේචනයෙන් වළකින්න. අනෙකාගේ ඔබ දකින පාපය, දුර්වලකම සමිඳුන් අබියස තබා ඔවුන්ගේ ගැළවීම උදෙසා යදින්න. සියල්ලන්ගේ ගැළවීම උදෙසා මොර ගැසීමයි, හැම කෙනෙක් තුළම සිදු විය යුත්තේ. දේව දරුකම උරුම කර ගත් ඔබ හැම අනෙකා විවේචනය කිරීමෙන් වැළකිය යුතුයි. දෙවිඳුන් හා ආදරයෙන් බැඳෙමින් එකිනෙකා හා අත්වැල් බැඳ ගැනීමයි, දේව දරුකමේ අයිතියේ මහා උරුමය.

ඔබ උදෑසන අවදි වන විට නිදි යහනින් නැගිට පළමුව කළ යුත්තේ ස්වාමිනි, උදා වූ අද දවස ඔබවහන්සේට බාරයි. නපුරා පරාජය කරනු සඳහා සියල්ලන්ගේ ගැළවීම උදෙසා පුජා වුණා වූ කල්වාරිය මත වැගුරුවා වූ ඔබගේ ශ්‍රී රුධිරය මේ මොහොතේ මා වෙත වගුරුවනු ලබන්න. ඔබගේ රුධිරය මගේ රුධිරයට සම්බන්ධ කරන්න. මගේ සිරුර පුරා තිබෙන අමාරුකම් අවයවයන්හි වේදනාවන් සියල්ල පහ කරන්න. මගේ රුධිරය තුළ තිබෙන්නා වූ අහිතකර බලපෑම් සියල්ල ඔබගේ දිව්‍ය රුධිරයේ බලයෙන් දුරු කරන්න. අද දවස පුරා ඔබගේ රුධිරය තුල මා පෝෂණය කරන්න. ස්වාමිනි, මගේ සිත කය සුවපත් කරන්නේ ඔබගේ රුධිරයයි. මිනිස් පවුලේ සියල්ලන් මත ඔබගේ රුධිරය වගුරුවමින් සියලු නපුරු බලවේගයන්ගෙන් ඔවුන් මුදා ඔවුන් සුවපත් කළ මැනව. ඔබ එලෙස යදින්න. දෙවියන් වහන්සේ පොරොන්දුවක් දෙනවා, ඒ පොරොන්දුව විශ්වාසය තුළ තදින් අයිති කරගෙන ගමන් කරන විට පියාණන් කැමති මොහොතෙදි ඒ පොරොන්දුව ඉටු කරනවා. මනුෂ්‍යයාට සොබා දහමත් එක්ක ලොකු බැඳීමත් තිබෙනවා. මනුෂ්‍යයා උදෑසන අවදි වුණාම එළියට බැහැල හිරු එළිය එක්ක සම්බන්ධකම ඇතිකර ගන්න ඕනැ. මනුෂ්‍යයාගේ ශරීරයට එය අවශ්‍යයි. ගස් වැල් ඇතුළු මුළු සොබා දහම සමග තිබෙන බැඳීම ගැන සිතන්න. මේවා ආදරයෙන් වැළඳ ගන්නට ඕනැ. වසර 28ක් පුරා මගේ මේ අනාවරණ රටාව තුළ නුඹලා පැමිණි ගමන් මගේ මීට වඩා උතුම් දවසක් ඉදිරියේ පැමිණෙනවා. පියවරෙන් පියවර ජයග්‍රහණය කරමින් සියලු අභියෝග පරාජය කරමින් පෙරටම යන්නට සිදු වෙනවා. එලෙස මෙය ස්ථිර වන තැනට සම්මතය කරා යන තැනට එනවා. එතෙක් ලොකු පීඩා, නින්දා කොන්වීම් අතරින් ගමන් කරන්න සිදු වෙනවා. එදා මට පැමිණි බාධක පීඩා සියල්ලම ඔබටත් තිබෙනවා. එනිසා ස්වාමිනි, ඔබ වහන්සේ ප්‍රේම කළාක් මෙන් අන් අයට ප්‍රේම කිරීමේ නිර්මල හදවතක් මා තුළ මැව්ව මැනවයි යදින්න. අද ඔයාලට යාච්ඤා කරන්නට බොහෝ දේ තිබෙනවා. ලොව පුරා රැකියාවක් නැතිව දුක් විඳින ජනතාව ඔබගේ මතකයට අරගෙන ඒ සියල්ලන් දේව හස්තයේ තබමින් ප්‍රේමයෙන් දෙවිඳුන් ඉදිරියේ මහා මොර ගැසීමක යෙදෙනවා නම් ශුද්ධාත්ම වරමින් ඒ වරප්‍රසාදය ඔවුන් වෙත ලැබෙන මගක් සැකසෙනවා.

දැන් මොහොතකට කලින් ඇන්තනි කතා කරන දේ මා අසා සිටියා. ඇන්තනිගෙ දැන් වයසත් එක්ක බැලුවම ඒ මතකය ශුද්ධාත්ම අනුග්‍රහයෙන් පිරිලා. මේ වයසත් එක්ක බොහෝ වේලාවට මතකය නැහැ, මෙහෙම ජවයකුත් නැහැ. ඇන්තනිට ශුද්ධාත්මය වගුරුවල තියෙන්නේ. ඒත් එයා කියන්නෙ එයාට එවැන්නක් දැනෙන්නේ නැහැ කියල. ඒ වරප්‍රසාදය දිල තියෙන නිසයි දරුවෝ, අද ඔහොම ඉන්නෙ. ශුද්ධාත්ම වරමින් වටිනා දේ මතකයට නගා ගෙන ඒ හැම දෙයක්ම ජනතාවට දෙන්නට ඔබට සිදු වෙනවා ඒ ශුද්ධාත්ම වැගිරීම තුළින් ඔබ ලබා ගත් ශුද්ධාත්ම වරමින් තමයි ඒ දේ කරන්නේ. මේ මොහොත වෙද්දි ඇන්තනිගෙ වයස කීයද? (84 ඉවර වෙන්ඩයි යන්නෙ.) ඇන්තනි, කොච්චර කාලයක් තව බලාපොරොත්තු වෙනවද? (මේ දැන් උනත්, ජේසු කැමති ඕනෑම වේලාවක මා එන්නට සූදානම්.) ඇන්තනි තව තියෙනවා නේද, වැඩ ටිකක්? තවමත් මතකය තියෙනවා, ජවය තියෙනවා. තේරුණාද ඇන්තනි? තව ටිකක් ඉම්මු නේද? ලෝකය දකින්නටත් එපැයැ. ඉතින් ඒ නිසා අඳුරට සිතන්න එපා, ධනාත්මකව පියවරෙන් පියවර ඉදිරියට යන්න."

**2024 ජූලි 19**

(1998 ජූලි 19 සිට සෑම වසරකම ජූලි 19 'දහම් නවෝදය' සංඝයේ අපි සමිඳුන්ට තුති දීමේ දිනයක් ලෙස එක්රැස් වීමු. ඊට හේතුව සෑම වසරකම එසේ කරන ලෙස ජේසු සමිඳුන් පැවසීමයි. ඒ ගැන 'ශුද්ධාත්ම පිය සටහන්' ප්‍රකාශනයේ සටහන් කර ඇත. වසරක් පාසා එසේ එක්රැස් වූ විට 1996 ජූනි 7 සිට අපගේ අතීත කතා පුවත සිහිපත් කළෙමු. මෙවර එක් වූ විට මා විශේෂ අවධානය යොමු කළේ වසර 21ක් අසම්මත ගමනකින් දැඩි ලෙස විඩාවට පත්ව සිටි අප සැම දිරි ගැන්වූ සමිඳුන්ගේ ප්‍රබල වචන ස්වල්පයකි. ඒ වචන අපට ලැබුණේ 2018 මැයි 13 වන දින ය. ඒ වචන ස්වල්පය තුළින් සංඝයක් ලෙස අප පසු කළ අතීතය ගැනත් අනාගතය ගැනත් අපට අවබෝධ විය. එදින ජේසු සමිඳුන් මගින් අපට ලැබුණු වචන ස්වල්පය මෙය යි. "මා තෝරා ගත් මේ සංඝයේ ප්‍රධාන දේ අත්තිවාරමයි. දැනට එයයි, සිදුවෙමින් පවතින්නේ. ඒ අත්තිවාරම මත ගොඩනැගිල්ල සෑදෙනවා. එවිට කාගෙත් අවධානය යොමු වන්නේ ගොඩනැගිල්ලේ අලංකාරය වෙතටයි. එවිට බොහෝ දෙනෙකුට අත්තිවාරම ගැන මතකයක් නැහැ. මේ සංඝය දැනට යමින් සිටින ගමනේ පේන්න වැඩ ගොඩක් නැහැ." ඉන්පසු මා අවධානය යොමු කළේ ජේසු සමිඳුන් සුනිමල් චතුරංග සොයුරා ඇමතූ පළමු අවස්ථාව පිළිබඳවයි. එය 2018 අගෝස්තු 9 සිදු විය. එය ජේසු සමිඳුන්ගේම අනාවරණයක් බව ඔහු දැඩිව විශ්වාස කළේය. ඔහු උපයෝගී කර ගනිමින් ලෝකයට පණිවුඩයක් දෙන්නට අවශ්‍ය බව දන්වා ඒ සඳහා අවශ්‍ය සියල්ල සකසන ලෙස ජේසු සමිඳාණෝ ඔහුට පැවසූහ. ඒ අනුව ඔහුගේ සුරතින් **http://dahamnavodaya.com** වෙබ් අඩවිය සැකසීය. 2020 පෙබරවාරි මස 8 වන දින වෙබ් අඩවිය අන්තර් ජාලයට විවෘත කිරීම (ජනවාරි 20 වන දින දුන් පණිවුඩය සමග) සිදු විය. 'දහම් නවෝදය' සංඝයේ එඩේරා හැටියට මම 2020 මාර්තු මාසයේ මැද දිනක ශුද්ධාත්ම පිය සටහන් 1 - 51 පරිච්ඡේද අන්තර් ජාලයට විවෘත කිරීම සඳහා සුනිමල් චතුරංග සොයුරා අත තැබුවෙමි. ජේසු සමිඳුන්ගේ නිවැරදි දහම දේශන ලෙස

ලෝකය ඉදිරියේ තැබිය යුතුය යි ජේසු සමිඳුන් මට පැවසූ නිසා 2023 ජුනි 16,17,18 අපි එයට මුල පිරුවෙමු. සුනිමල් චතුරංග සොයුරා YouTube නාලිකාව සකසා ඒ දේශන 60 ඔබ ඉදිරියේ තබා ඇත. අන්තර් ජාලයේ **dahamnavodaya** ලෙස සටහන් කර ඒ YouTube නාලිකාව වෙත පිවිසෙන්න. අපි ඒ කරුණු එදින බෙදා ගතිමු. ඉන්පසු ජේසු සමිඳාණෝ මෙලෙස අප ඇමතූහ.)

**2024 ජුලි 19**

"පියාණෝ ද පුත්‍රයාණෝ ද ශුද්ධාත්මයාණෝ ද වන මම නුඹලා ආශිර්වාද කොට ආරක්ෂා කරමි, පොරොන්දු වෙමි. ඉතින් කොහොමද, අද දවස. සතුටුයි, සියල්ලන් පැමිණීම ගැන. මේ ගමන් මග පිළිබඳව ඇන්තනි දුන්නා වූ අර්ථකථනය මා අසා සිටියා. ඇන්තනි කීවා හරි, අත්තිවාරම දැම්මා. නමුත් මේ අත්තිවාරම දාන්න කලින් මම මොකක්ද කළේ ? මම කළේ අත්තිවාරමට සුදුසු ශක්තිමත් බොල් නොවන ගල් වැලි තෝරා ගැනීමයි. අත්තිවාරමක් ගොඩනගනවා නම් ඒක ශක්තිමත් වන්නට ඕනැ. ඒ ශක්තිමත් අත්තිවාරම මත තමා ගොඩනැගිල්ල ඉදිකෙරෙන්නේ. මේ ගොඩනැගිල්ල ඉදිකරන්නට මං බොහෝ කලක් බලා සිටියා. අත්තිවාරම දැම්මට ගොඩනැගිල්ල සකස් කරන්නට සුදුසු කෙනාව පියාණන් මට ප්‍රකාශ කරන තුරු මා බලා සිටියා. ඒකට සුදුසු කෙනාව පියාණන් විසින්ම තෝරා දුන්නා. ඒ චතුරංග. අත්තිවාරම සකස් කරල දැන් ගොඩනැගිල්ලේ අලංකාරය බලන්නටයි, සූදානම. දැන් ගොඩනැගිල්ල සකස් වෙමින් පවතිනවා. ගොඩනැගිල්ලේ අලංකාරය දිස් වන්න නම්, මේ ප්‍රකාශනය ජාත්‍යන්තරයට යා යුතුයි. තවමත් කොටසයි, දීල තියෙන්නේ. ඉතිරි කොටස් කෝ ? ගොඩනැගිල්ල සම්පූර්ණ වෙන්න එපැයැ. ඒක යා යුතුම නේ? ඒක නොවී කොහොමද, අලංකාරයක් දකින්නේ? ගොඩනැගිල්ලේ අලංකාරය දකින්න නම් මේ ප්‍රකාශනය භාෂා සියල්ලෙන් ලෝකයට යන්න ඕනැ. ගොඩනැගිල්ලේ එක කොටසයි දැනට සම්පූර්ණ වෙමින් පවතින්නේ.

අද ලෝ වැසි ජනතාවගේ පුරුද්දක් තියෙනවා, ඒ හැම දෙයක්ම විවේචනය කිරීම. දැන් මේක මෙතැන අලංකාරයි, මෙතැන ඇදපළුදුයි අන්න ඒ වගේ මේකෙත් ඉන්නවා ඇදපළුදු දකින අය. ගොඩනැගිල්ල සකස් කරමින් එහි අලංකාරය දකින කොටසක් ඉන්න අතරේ එහි අලංකාරය නොදකින කොටසකුත් ඉන්නවා. ඒ සඳහා පියාණන් නිහඬ ගමනේ සියල්ල නිරීක්ෂණය කරමින් සිටිනවා. නමුත් තවමත් ඇදපළුදු දකින අය රොඩු එකතු කරන අය, ඒ රොඩු අයින් කරන්නට බලා සිටින පියාණන් ඒ සඳහා කාලය දී තිබෙනවා. පියාණන්ගේ මහා පවිත්‍රකරණය එයයි. විශාල ජනතාවක් පවිත්‍ර කරමින් මේ නිවහන ලෝකය නමැති ගෘහය, දේව රාජ්‍යය නමැති ගෘහය ගොඩනගන්නට ඒ හැම කෙනෙක් තුළම තිබෙන්නා වූ අඩුපාඩුකම් ඉවත් කරමින් ඒ අයව පවිත්‍ර කරමින් ගොඩනගන්නට දැන් ලහිලහියේ සූදානම්ව සිටිනවා.

සැබැවින්ම මේ දේශය තව නොබෝ දිනකින් විශාල පවිත්‍ර කිරීමකට ලක් කරනු ලබනවා. එය මේ මොහොතෙ මා නුඹලාට දෙන විශේෂ අනාවරණයක්. දැනටමත් ධන, බල ලෝභය සඳහා වෛර දරමින් ජනතාව පීඩනයට පත් කරන පසුබිමකුයි රටේ පවතින්නේ. මේ දේශය අපවිත්‍ර කරන සියල්ලන් ඉවත් කරන කාලය එළඹෙමින් තිබෙනවා. එනිසා මා නිහඬයි වගේ සිටියට මම නිහඬ නැහැ දරුවෙනි. පියාණන්ගෙ උදහස ලැව් ගින්නක් සේ ඇවිලෙමින් තිබෙනවා. මුළු ලෝකයම විවිධාකාර පැතිකඩවල්වලින් මේ පවිත්‍රකරණය ආරම්භ වූ තැන් පටන් තවම පවිත්‍රකරණය නිමා වෙලා නැහැ. තවම එහි මැදටවත්, ඇවිත් නැහැ. භයානකම දේ තමා ඊළඟට පැමිණෙන්නට සිටින ෆ්‍රීමේෂන්වරුන්ගේ කාලය, අන්ත ක්‍රිස්තුගේ (Anti Christ) කාලය. අන්ත ක්‍රිස්තුගේ කණ්ඩායම මේ මොහොතෙ හිස ඔසවා ගන්න බැරිවයි ඉන්නේ. මක්නිසාදයත් හැම තැනකම යාච්ඤා කණ්ඩායම් මොර ගසමින් සිටින නිසා. මගේ ප්‍රමුඛ සභාවට මොකද වෙලා තියෙන්නේ ? අනාදියේ සිට තිබුණු යාච්ඤාවල වචන වෙනස් වෙමින් විකෘති වෙමින් දේව වන්දනාව වියවුල් වෙමින් තිබෙනවා. එදා ඒ යාච්ඤා තුළ තිබුණු බලගතුභාවයට යක්ෂයා බියයි. මේ සිදු වන හැම වෙනසක්ම අධර්මාධිපතිගේ රාජ්‍යය ගොඩනගන්නට කරන සූදානමක්. ඒ සියල්ල අග මගේ දෙවන පැමිණීම සිදු වෙනවා. අධර්මය වෙනුවෙන් ක්‍රියා කරන කණ්ඩායම්වලට අවස්ථාව දීලා ඒ දී තිබෙන කාලය අවසන් කරන්නටයි පියාණන් සූදානම් වන්නේ. එනිසා භයානකම යුද්ධයක් මුළු ලෝකය තුළම ඇවිලෙමින් තිබෙනවා. දෙවි පියාණන්ගේ මහා පවිත්‍රකරණය සඳහා මේ දේශය මූලික වෙමින් තිබෙනවා. ඊට හේතුව ආදම් සහ ඒව මේ දේශයට යි, අදාල වන්නේ. මේ පුංචි රටට ඒක සීමා වෙලයි තියෙන්නේ. මුලින්ම පාපය උපන්නෙ මේ දේශයේ. එනිසා පාපයේ බර වැඩිම මේ පැත්තටයි. යක්ෂයා ලොකු සටනක් දෙනවා ඒක අයිති කර ගන්නට. එනිසා දෙවි පියාණන් විසින් රහසිගත ගැඹුරු දෙයක් මේ දේශය තුළ සිදු කරන්නට යනවා, මහා පවිත්‍රකරණය උදෙසා. එනිසා ඇන්තනි, මා නුඹලා ගෙන යන මේ ගමන ගැන මා ගැඹුරු වදන් නොකීවාට සිදුවන දේ ගැන අවදිව සිටින්න. මෙය සුළු කොට තකන්නට එපා. මා නුඹලා ගෙන යන ගමන් මගේ ගැඹුර තියෙන්නෙ තව ඉදිරියට. අන්න එදාට තේරෙනවා, මෙතැනින් ඈත් වූ අයට වැළපෙන්නට සිදුවන බව. මෙලෙස පැමිණෙමින් සිටින ස්වාමින් වහන්සේව අපි හඳුනා ගත්තෙ නැහැ නේද කියල ඔවුන් හඬා වැටෙන තැන් එනවා. මම මේ

දේශයෙන් සුවිශේෂී අනාවරණ රටාවක් ලෝකයට දීලා තියෙනවා. ඒ සඳහා මම වචනවලින් කතා කරල තියෙනවා, දෙනෙත්වලින් කතා කරලා තියෙනවා සුරතින් ලියල තියෙනවා. දෙපාවලින් ඇවිදල තියෙනවා. ඉදිරියටත් මනුෂ්‍ය ස්වරූපයට ඇතුල් වෙලා මම මගේ ප්‍රථම දාසියව රැගෙන යනවා යා යුතු තැන්වලට. --- ඉදිරියේදී අල්තාරවලින් බැහැල සුරුවම් (ප්‍රතිමා) ඇවිදින්න පටන් ගන්නවා. මම ජීවන හුස්ම දෙනවා, ඒ සුරුවම්වලට. මනුෂ්‍යයො භය වෙලා දුවන්න පටන් ගන්නවා. ඉදිරියේ තව බොහෝ දේ සිදුවෙනවා, එය බොහොම ආසන්නයි. මේ ලෝකයේ පාපය වැඩිකම නිසා දේව මාතාවන් මැදිහත් වෙනවා, ඇගේ දෙනෙතින් ලේ කඳුළු ගලා යනවා. ඉතින් ඒ නිසා සැබවින්ම ඉදිරියෙ දි දේවස්ථානවලින් එළියට බැහැල සුරුවම් ඇවිදින්න පටන් ගන්න මොහොතක් එනවා. ඉතින් ඒ හැම දෙයක්ම ඉදිරියෙ සිදුවන්නට තියෙන දේ. ඒවා අරුම පුදුම දේ ලෙස මනුෂ්‍යයා සොයන්නට පටන් ගන්නවා, ගවේෂණාත්මකව. අද හැම තැනම තියෙන්නෙ පරීක්ෂණනෙ. හැම දේම ඇසින් දැක්කත් ඒත් පිළිගන්නේ නැහැ. එදත් තිබුණෙ ඒකමනෙ. දෙවියන් මහා පොළොවට ආවත් ඒ දෙවියන්ව හඳුනා ගත්තෙ නැහැනෙ එදා ජනතාව."

(ශල්‍යකර්මයකට සූදානම් වන වෛද්‍යවරියකගේ පුතෙක් උදෙසා උන්වහන්සේ කළ කී දේ මුල් කරගෙනයි, ජේසු සමිඳුන් මේ වචන අප හා පැවසුවේ.) "ප්‍රේමවන්ත දරුවෙනි, ඉදිරිය තවත් භයානකයි, ඒත් මේ ගමන වැරදිලා නැහැ. එනිසා හැම දේකදීම සියල්ලන් එකමුතු වෙලා දේව ශුද්ධභාවය අත්දකින්නට සූදානම්ව සිටින්න. දෙව් පියාණන් යමෙකුට පැවසුවොත් ඔබ අද මගේ රාජ්‍යයට පැමිණෙන්න ඕනැ කියල සියල්ල අත්හැරල ඊට සූදානම් වෙන්න ඕනැ. ඔබගේ දරුවන් ගැන ඔබ තුළ බැඳීමක් තිබෙනවා, ඒ බැඳීම් දීලා තියෙන්නෙ දෙව් පියාණන්. එහෙත් යම් මොහොතක පියාණන් පැවසුවොත් ඔබ එයින් හිස් වන්න, මම ඉතිරි ටික බලා ගන්නම් කියල ඒත් ඔයාලට අපහසුයි හිස් වෙන්න, ඒ බැඳීම් ඔයාලගෙ ශරීරයේම කොටසක් වෙලා. නමුත් පියාණන් කියනවා ඒ ශරීරයේ කොටස දැන් අත්හරින්න කියලා. එවැනි මොහොතවල් ඉදිරියේ පැමිණෙනවා, ඒ පවුල බොහොම අමාරුවෙන් මුළුමනින් හිස් වීම, තුළ තමයි, ඒ පරීක්ෂණයෙන් දරුවා නැවත දිනාගත්තේ. ඒ පරීක්ෂණය සඳහා මා ඇයි එහෙම පවුලක් තෝරා ගත්තේ ? මගේ මේ ක්‍රියාවලිය විශ්වාස කරන ඔවුන් තුළ තිබෙනවා මේ ගමනාන්තය දක්වාම යන්නට සූදානමක්. මා මේ ගමන යන්නට තෝරා ගෙන තිබෙන අයට පීඩා වැඩියි. මා නිතරම විශ්වාසය පරීක්ෂා කරල බලනවා. වචනයෙන් පමණක් කිව්වාට මදි, වචනයෙන් පමණක් කියන අය ඕනැ තරම් ඉන්නවා. මම ඔබගෙ ජීවිත ක්‍රියාවලිය බලනවා. දෙවියන් සමග සෙල්ලම් කරන්නට සූදානම් වන්නට එපා, කිසිම කෙනෙක්. දෙවියන් වහන්සේ නිදහසේ යන්නට ඉඩ දෙනවා, ලුහු බඳිනවා, නිසි තැනදී ආපසු අරගෙන එනවා. මේ ශුද්ධවූ ගමන සඳහා මා තෝරා ගත් ශ්‍රාවකයින් එයින් ඈත් වුණත් කොහේ හිටියත් මා කැඳවන විදියක් තියෙනවා, යන දුර යන්න ඉඩ දීලා ආපසු කැඳවන විදියක් තියෙනවා දරුවෙනි, භය වෙන්න එපා. ඔවුන් කළ කී හැම දෙයක්ම අවබෝධ වෙලා, බොහෝ දේ දැකලා රට පුරා ලොව පුරා ඒ අයව අරගෙන ගිහිල්ල, ඒ අයගෙන් මා තවත් ප්‍රයෝජන අරගෙන, පවිත්‍ර කරල, මම ඔවුන්ව නැවත රැගෙන එනවා. මා වචනයෙන් ඔබට නොකීවත් ප්‍රබල දේ ඔබටත් නොදැන මම ලොව පුරා සිදුකරමින් සිටිනවා. ඒ අනාවරණයන් ඉදිරියේ දී නුඹලාට දැන ගන්නට ලැබේවි. අපි දැන් නිමා කරමු නේද? සියල්ලෝ එක වර හිස පහත් කර ගන්ඩ.

හිසේ සිට දෙ පතුල් දක්වා ඇට මස් ලේ නහර හැම ස්නායුවක් මාංශ පේශියක් කරා මා ගෙව්වා වූ මිලය මා වැගුරුවා වූ රුධිරය මම ඔබට අයිති කර දෙන්නෙමි. විශ්වාසයෙන් යුතුව එය අයිති කර ගන්න. මා තුළ ජීවත් වෙන්න, මම ඔබ සුරකිමි සැම දා.

සුදතුමිගේ ශුද්ධාත්ම වරම් තුළ මම ඔබ රඳවන්නෙමි. දෙව් මහෝත්තමයාණන්ගේ මහා බලසම්පන්න බල මහිමය තුළ මම ඔබ රඳවන්නෙමි. පියාණන්ගේ බැල්ම තුළ මම ඔබ රඳවන්නෙමි, පියාණෝ ද පුත්‍රයාණෝ ද ශුද්ධාත්මයාණෝ ද වන ත්‍රිත්වික දෙවියන් වහන්සේගේ බැල්ම තුළ මම ඔබ රඳවන්නෙමි. සියලු සුරදූතයින්ගේ රැකවරණය තුළ මම ඔබ රඳවන්නෙමි. සියලු ශුද්ධවන්තයින්ගේ මැදිහත්භාවය තුළ මම ඔබ රඳවන්නෙමි. මරිමවුගේ මැදිහත්භාවය තුළ මම ඔබ රඳවන්නෙමි. ජේසු බිළිඳුන්ගේ මිත්‍රශීලි ස්වභාවයට මම ඔබලා බාර කරමි. මේ පොළෝතලය තුළ ජීවත් වන තුරා යහපතානුකූලව ජීවත් වෙමින් ස්වාමින් වහන්සේට ප්‍රසන්න දිවි පෙවෙතක් ගත කරමින් ස්වර්ගය දිනා ගන්නට වරම් ලැබේවා ! එවෙනු ෂාලොම් අලෙහෙම් (ප්‍රථම දාසිය මගින් ජේසු සමිඳුන් තම අනාවරණයන් අවසන් කරන්නේ මෙසේ ය.)

**2024 සැප්තැම්බර් 02**

"ඉතින් අද විශේෂ දවසක්, මමයි අද මෙතැනට ඔබ සියල්ලන් රැස් කළේ. ඒකට හේතුව දැන් මා ඔබට පවසන්නම්. මගේ මේ දූත මෙහෙවරේ ගැඹුරුම අදියරට මා තෝරා පත් කර තිබෙන්නේ ඔබවයි, චතුරංග. ඉතා දුෂ්කර ගමනකටයි මා ඔබව තෝරල තියෙන්නේ. බොහෝ දැනුම් සම්භාරයක් ඇතිව සභාව සමග ජනතාව සමග ලොකු සටනක් කරමින් ලොකු කාර්යයක් මා උදෙසා බාර අරගෙන කරන එක පහසු නැහැ, ධර්ම අධර්ම යුද්ධය තුළ නිසා එය කොහෙත්ම පහසු නැහැ.

ඉතින් අද එයාගෙ උපන් දිනය සමරන දවස. අද දවසට නියමිත පූජා කියවීම් තුළ ඉතා වටිනා පණිවුඩයක් අන්තර්ගතව තිබෙනවා. අපි දැන් එය කියවා බලමු. (1 කොරින්ති 2 : 1 - 5 ගිතාවලිය 119 : 97 - 102 ලූක් 4 : 16 - 30)

"මේ පුතණුවන් කුස දරූ ඔබ භාග්‍යවන්ත මවකි. විවිධාකාර අභියෝග හරහා පුතාව කැඳවනු ලබල තියෙනවා. අදට වසර කියක්ද සම්පූර්ණ වුණේ ? (39ක් සම්පූර්ණ වුණා) මෙතැන් පටන් ඉදිරියටත් මොන අභියෝග ආවත් දෙවියන් වහන්සේගේ රැකවරණය ඔබට තිබෙනවා. ඒ මව දරුවා බිහි කරල මව ද පියා ද එක්ව යහපත් මාර්ගය දරුවට කියල දීල තිබෙනවා. ඒ පියා දැන් ස්වර්ගයේ ඉන්නවා. දෙවිඳුන්ගේ මාර්ගයේ දිගටම ගමන් කළ ඔබගෙන් මා තනිකඩ ජීවිතයක් නොවෙයි බලාපොරොත්තු වන්නේ. ඔබගෙන් පරපුරක් බලාපොරොත්තු වෙනවා, දෙවි පියාණන්. ඊළඟ පරම්පරාව ගෙනියන්නට ඔබගෙන් තව සුදුසු කෙනෙක් ඉස්සරහට ගන්නට ඕනැ. නියමිත මොහොතේදී දෙවි පියාණන් විසින් ඔබට සුදුසු කෙනාව ඔබ ඉදිරියට පමුණුවනු ඇත. ඒ වන විට ඔබට බාධක වන සියල්ල මම නිදහස් කරල දෙන්නම්. එතෙක් මේ ගමන මේ ශ්‍රාවක පිරිස හා එකමුතු වෙමින් යන්නට ඔබට පුළුවන්. අප කියවා මෙනෙහි කළ ගීතාවලියේ ගීතයෙන් කියවෙනවානේ වැඩිහිටියන්ට වඩා නැණ නුවණින් ඒ අයට ගුණදම් කියා දෙමින් ඉදිරියට යන්න ආලේප ලත් අයෙක් බව. දැන් මම ඔබ ආලේප කරල ආශිර්වාද කරනවා. එන්න පුතා, මා අබියසට."

"ස්වර්ගයෙන් ලද තිළිණය මව් කුසට තැන්පත් වීමේ සිට මේ පොළොවට පැමිණි දා පටන් වසර 39ක් සම්පූර්ණ කරමින් 40ස් වන වසරට පා තබා තිබෙන ඔබට පියාණන්ගේ මහා විශේෂ ආලේපයක් තුළ විවිධ බාධක කම්කටොළු ජය ගනිමින් ගිනි උදුනේ දවාලන ශුද්ධවූ ගිනි ජාලාවක් හරහා ගමන් කරන්නට මම ඔබව ආලේප කරමි. පියාණන්ගේ ආඥාව පරිදි මම ඔබව විවිධ බාධක කම්කටොළු පරාජය කරමින් ඒ මහා වතුර කට්කත්වය තුළ සභාව තුළ පවා ලෝකය තුළ විවිධ තරාතිරම් නොබලා ඒ සියල්ල යක්ෂයා හා අධර්මය පරාජය කරමින් විශේෂ ගමන් මඟකට මම ඔබ කැඳවමි. ආමෙන්."

**2024 ඔක්තෝබර් 23**

(එදින ජේසු සමිඳුන් සුනිමල් චතුරංග සොයුරාට දුන් පණිවුඩයේ මෙම අදහස් ද ඇතුලත් විය) "මේ ලෝකය ඔබේ දේශය, ඔබේ ග්‍රාමය පිළිබඳ ඔබ ලොකු අවදි වීමක ඉන්නට ඕනැ. මේ දේශයේ බොහොම කෙටි කාලයකදී තව විශාල දෙයක් සිදු වෙන්නට තිබෙනවා. ඒ දේ කුමක්ද කියා මම කියන්නෙ නැහැ. ජේසු මෙහෙම ඉඟියක් දුන්නා කියල මතක තබා ගන්න. මේ රටේ ජනතාවගේ මොරගැසීම් නිසා දෙවි පියාණන් විසින් රාජ්‍යයට නායකයෙක් පත්කරල දීල තිබෙනවා. බලය ලැබීමේදී ඔහු තුළ මොන අරමුණු තිබුණත් ඒ සියල්ල අභිබවා ධර්මය දෙසටම නැඹුරු වන්නට දෙවි පියාණන් සැලැස්සුවා. අයහපත් සියල්ල යහපතට හරවලා ඔහුගෙන් මේ ප්‍රතිපලය නෙලා ගන්නටයි දැන් පියාණන් සූදානම් වන්නේ. මේ සමගම දෙවි පියාණන්ගේ පවිත්‍රකරණයේ බිහිසුණු අදියරයි, මේ දේශයටත් මුළු ලෝකයටත් උදා වන්නේ. රට අගාධයට ඇද දැමූ සියලු වංචා දූෂණ සොයා බලමින් වැරදිකරුවන්ට නිසි දඬුවම් ලබා දීම තමයි දැන් එයා කරන්න යන්නේ. ඒ සඳහා බලයක් දෙවි පියාණන් ඔහුට දීලා තියෙනවා. දැන් හැම තැනක්ම පවිත්‍ර කරන කාලය ඇවිත්. මේ මහා පන්නරයත් සමග ඔබ සැම ද අධ්‍යාත්මිකව පිබිද සිටිය යුතුයි."

**2024 දෙසැම්බර් 03**

(චතුරංග සොයුරා අමතා ජේසු සමිඳුන් දුන් පණිවුඩයකි)

"මේ මොහොතෙ තමා කළ යුත්තේ කුමක්ද? ඒ දේට විවෘත වීමයි අවශ්‍ය. ආත්මානුභාවයෙන් දෙවි පියාණන් මට මොනවාද පවසන්නේ? ඇන්තනිට කතා කරන තැන් තියෙනවානෙ. මීට කලින් එයා එලෙසනෙ ආවෙ. ඉදිරියට ඒ තත්ත්වය තුළ තමා යන්නට වෙන්නෙ. ඇන්තනි තුළින් තව ගත යුතු දේ තියෙනවා. එයාම මෙනෙහි කරල ආත්මානුභාවයෙන් එයා තුළට දෙවි පියාණන්ට ඉඩ දීලා ඒ සෙවීම එයා ආයෙ ආරම්භ කරන්න ඕනැ. ඒක ජේසු කීවා කියල ඇන්තනිට කියන්න. එදා පටන් එයා ආත්මික මෙහෙය වීම තුළ ආවනෙ. නැවතත් ඒකට එයා උනන්දු වී අවතීර්ණ වුණොතින් ඒ පරිණතභාවය තුළ එයාට තව දේවල් ආත්මගත කරගෙන තව එයාටත් සැඟවී තිබෙන දේ ප්‍රගුණ කර ගන්න පුළුවන්. මා දෙන්නට පොරොන්දු වූ පණිවුඩය දෙසම බලා සිටින්නට අවශ්‍ය නැහැ. ඒ පණිවුඩය එයාගෙ ආත්මයට දෙන්නත් මට පුළුවන්."

ජේසු සමිඳුන්ගේ එම පණිවුඩය ගැන අවධානය යොමු කරන විට මට හැඟුණේ 'දහම් නවෝදය' සංඝයේ එඬේරා හැටියට මේ මොහොතට අදාල වන අදහස් ස්වල්පයක් ජේසු සමිඳුන් මගෙන් ද බලාපොරොත්තු වන බවයි. එය මා සටහන් කළ පසු ජේසු සමිඳුන් මගින් දෙවි පියාණන්ගේ පණිවුඩය ලැබෙනු ඇතැයි මම සිතමි. දේශය ඔසොවා තබන දැහැමි නායකත්වයක් උදෙසා මැවුම්කරුවාණන් වහන්සේට ඔහු සුදුසු වූයේ කෙසේද? ශුද්ධ බයිබලය මෙලෙස පවසයි. "මනුෂ්‍යයෝ පිටාතර පෙනීම බලති. දෙවියන් වහන්සේ සිත බලන සේක." (1සාමුවෙල් 16:7) උන්වහන්සේ බලන්නේ අරමුණේ අවංකභාවය තිබෙන සිතක් දෙසයි. එවැන්නෙක් හමු වූ විට එතුමාණෝ ඔහු තුළ නිවහන්ගත වී තම ප්‍රඥාව ඔහුට අනාවරණය කරති. මැවුම්කරුවාණන් වහන්සේට ආගම් භේද නැත. හැම මනුෂ්‍ය ජීවිතයක්ම උන්වහන්සේගේ උතුම් මැවීමකි. උන්වහන්සේ හැම මනුෂ්‍ය ජීවිතයකම පියාත් මවත් වන සේක. සියල්ලෝ උන්වහන්සේගේ දරුවෝ වෙති. එනිසා සියල්ලෝ සහෝදර සහෝදරියෝ වෙති. අරමුණේ අවංකභාවය ඇති සිතක් යනු කුමක්ද? දිගු කලක් තිස්සේ රට මුහුණ දෙන ඛේදවාචකය දෙස බලා මහත් කම්පනයකින් යුතුව ඒ තත්ත්වයෙන් ජනතාව මුදා ගෙන ඔවුන්ට ජීවත් වන්නට සුදුසු දේශයක් නිර්මාණය කර තමාට මිය යන්නට සිදු වුවත් කම් නැතැයි සිතන අයෙකි. මැවුම්කරුවාණෝ ඔහු තුළ එවැන්නෙක් දුටහ.

ජේසු සමිඳුන්ගේ දෙවන පැමිණීමට දැහැමි යුගයක උදාවට තව දිගු කාලයක් ඉතිරිව නැත. එය අවුරුදු 10ක් 15ක් තුළ ඉටුවන දෙයක් යැයි සිතා ගැනීම කාටත් ගුණදායකය. දෙවි පියාණන්ගේ පුත්‍රයාණන් වන ජේසු සමිඳුන් මිනිස් බව ගෙන වැඩියේ පාපි ලෝකයකටය. ජේසු සමිඳුන් නැවත වඩින්නේ පවිත්‍ර කළ ලෝකයකටය. ඒ පවිත්‍ර කිරීම කරන්නෝ දෙවි පියාණෝ ය. දෙවි පියාණන්ගේ පවිත්‍රකරණයේ පළමු අදියර ඇරඹුණේ 2019 අප්‍රේල් 21 පාස්කු බෝම්බ සිද්ධියෙනි, 2020 කොරෝනා වසංගතයෙනි. දෙවි පියාණන්ගේ පවිත්‍රකරණයේ බිහිසුණු අදියර ඇරඹුණේ 2024 සැප්තැම්බර් 21 අපගේ දේශයට නව නායකත්වයක් මතු කරමිනි. ඒ සමගම පවිත්‍රකරණයේ බිහිසුණු අදියර ලොව පුරා ව්‍යාප්ත වනු ඇත. දෙවි පියාණන්ගේ පවිත්‍රකරණයේ පළමු අදියර ඇරඹීමත් මේ දේශයෙනි. පවිත්‍රකරණයේ බිහිසුණු අදියර ඇරඹීමත් මේ දේශයෙනි. ඒ ඇයි? මේ දේශය ආදම් සහ ඒව සිටි සුගති උද්‍යානය, පාරාදීසය නිසා ය. එනිසා දැහැමි යුගයේ උදාව දක්වා ඉදිරි සියලු සැළසුම් ඇරඹෙන්නේ ද මෙම දේශයෙන් ය. මුලින්ම පාපය උපන්නේ ද මෙම දේශයෙන් ය. එනිසා ආදි මව් පියෝ පාරාදීසය අහිමි කර ගත්හ. දෙවි පියාණන්ගේ පවිත්‍රකරණය මගින් සිදු වන්නේ මනුෂ්‍යයා ද උපයෝගි කර ගනිමින් පාරාදීසය නැවත ගොඩනැගීමකි. දැහැමි යුගයේ උදාව යනු එයයි. දෙවි පියාණන්ගේ පවිත්‍රකරණයේ අති බිහිසුණු අදියර ඉදිරියේ දී සිදුවනු ඇත. ඉන්පසු ජේසු සමිඳුන්ගේ දෙවන පැමිණීම හා දැහැමි යුගයේ උදාව සිදු වේ.

දෙවි පියාණන්ගේ පවිත්‍රකරණයේ පළමු අදියර ගැන මා කෙටියෙන් හෝ කතා කළ යුතුය. එය පාස්කු බෝම්බ සිද්ධියයි. 2021 පෙබරවාරි 24 වන දින ජේසු සමිඳාණෝ සිය ප්‍රථම දාසිය මගින් මෙලෙස පැවසුහ. "2019 පාස්කු ඉරිදා සිදුවීම් පිළිබඳ දැන් මේ දේශය තුළ මගේ සභාව තුළ සිදුවන බොහෝ දේ දෙස මම වේදනාවෙන් බලා සිටිමි. පසුගිය සිදුවීම්, ඉදිරි සිදුවීම් කෙතරම් බිහිසුණු වුව ද කිතුනු නාමය දරන මගේ ජනතාවගෙන් මා බලාපොරොත්තු වන්නේ සමාව දීම පමණයි. මේ සියල්ල දෙවි පියාණන්ගේ සාධාරණත්වයට භාර දෙන්නට ඔබට මගෙන් අවසර ඇත. මේ සඳහා වැරදිකරුවන් සොයමින් ඔවුන්ට දඬුවම් ලබා දීමට කටයුතු කිරීම කිතුනු නාමය දරන කිසිවකුගෙන් මම බලාපොරොත්තු නොවෙමි." ('ශුද්ධාත්ම පිය සටහන්' 53 පරිච්ඡේදය) මම එය අති ගරු අගරදගුරු තුමා ඇතුළු සභා ශ්‍රේෂ්ඨයින්ට දැන්වීමි. කිතුනු ජනතාවගේ අති උතුම් දිනයක් වන ජේසු සමිඳුන්ගේ උත්ථානයේ මංගල්‍යය පැවැත්වෙන පාස්කු ඉරිදා දෙවි මැදුරු තුනක දේව මෙහෙය තුළ මෙවැන්නක් සිදුවන්නට දෙවිඳුන් ඉඩ දුන්නේ ඇයි? මෙවැන්නක් ගැන සිතන්නටවත් කතෝලික සභාව මෙතෙක් උත්සාහයක් ගෙන නැත. 2023 මැයි 13 ප්‍රථම දාසිය මගින් ජේසු සමිඳාණෝ මෙසේ පැවසුහ. "අද මොකක්ද සභාවෙ වෙන්නේ? එදා මම ජුදස්ටත් සමාව දුන්නා. ඇයි, සභාවට අද සමාව දෙන්නට බැරි? ඇයි වරුදිකරුවන් සොයමින් ජනතාව රැස් කරන්නේ? දැන් ඔය බෝම්බ සිද්ධිය ගන්නකො, ඒ ගැන මිනිසුන්ගෙ ඇතුලෙ පැසවන තුවාල සුව වේගෙන යනකොට ආයෙ වසරකින් එය එළියට ගන්නවා, ඒ තුවාල පාරනවා. එය සභාව කරන ලොකු වරදක්නෙ, සමාව දීමේ ක්‍රියාවලියක් නොවෙයිනෙ. මේ තත්ත්වය තුළ මගේ පූජක සක්‍රමේන්තුව ගැන මොකක්ද ලෝකයා දකින්නේ? මේ තත්ත්වය තුළ කිතුනු සභාව ගැන අද ලෝකයා මොකක්ද කතා වෙන්නේ? එසේ නම් ලෝකයත් මගේ සභාවත් සමානයිනෙ." ('ශුද්ධාත්ම පිය සටහන්' 64 පරිච්ඡේදය)

දෙවි පියාණන්ගේ පවිත්‍රකරණයේ බිහිසුණු, අති බිහිසුණු සිදුවීම් කිතුනු ජනතාවට පමණක් සීමා වන්නක් නොවේ. සමස්ත ජනතාවටම ඒ අත්දැකීම්වලට මුහුණ දෙන්නට සිදුවනු ඇත. මා මෙහි සඳහන් කළේ ඒ සියල්ලෙන් බිඳක් පමණි. 'ශුද්ධාත්ම පිය සටහන්' 56 පරිච්ඡේදයේ සිට 65 පරිච්ඡේදය දක්වා මා ඒ පිළිබඳ සියල්ල සටහන් කර ඇත. ඒ සියලු කරුණු ඒ පරිච්ඡේද පුරා තැනින් තැන විසිරී ඇත. ඒ සියල්ල ගැඹුරින් අධ්‍යයනය කර ඉදිරි සිදුවීම්වලට මුහුණ දෙන්නට සූදානම් වන්න.

ජේසු සමිඳුන් විසින්ම ආරම්භ කළ කතෝලික සභාව ගැන වචන ස්වල්පයක් සටහන් කරන්නට මම කැමැත්තෙමි. අනෙක් සෑම කිතුනු නිකායක්ම ආරම්භ කළේ මනුෂ්‍යයින් විසිනි. සභාව ආරම්භ කරමින් නිරාදොරටු ඊට විරුද්ධව ජය නොගන්නා බව ජේසු සමිඳාණෝ පොරොන්දු වූහ. සමහර හේතූන් නිසා කතෝලික සභාවෙන් ඉවත්ව සිටින සියල්ලන්ට මෙම සුවිශේෂී අනාවරණ රටාව තුළ ජේසු සමිඳාණෝ මෙසේ පවසති. "මගේ අසරණ බැටළුවන්ට මෙය ද පවසන්න. මා දමා ඇති ඒ අත්තිවාරම මත මා පිහිටෙව්වා වූ මගේම සභාව තුළ හෙවත් මගේ ප්‍රමුඛ සභාව වන කතෝලික සභාව තුළ පමණක් රැඳී සිටින්න. මගේ නාමයෙන් ඇත් වන මගේ අනුහාවයෙන් ඈත් වී ඇති නොයෙක් ආකාරයේ ව්‍යාජ සභාවන් තුළ ගැළවීම සොයන්නට නොයන්න." (ශුද්ධාත්ම පිය සටහන් 23 පරිච්ඡේදය) ඒ වචනය විවිධ කිතුනු නිකායන් තුළ දිගු කලක් ජීවත් වන කිතුනුවන් සඳහා නොවේ. අද කතෝලික සභාව තුළ විවිධ අඩුපාඩුකම් ඔබ දකිනු ඇත. මෙම අනාවරණ රටාව තුළ ජේසු සමිඳාණෝ මෙසේ ද පැවසූහ. "ව්‍යවස්ථාවන්ගෙන් ද සංස්ථාවන්ගෙන් ද සංයුක්ත වූ මගේ සුනුවිසුනු වන්නා වූ සභාව ශුද්ධාත්මයාණන් විසින් මෙහෙය වන තත්ත්වයට මම ඔසවන්නෙමි." ('ශුද්ධාත්ම පිය සටහන්' 21 පරිච්ඡේදය) එය කොතෙක් බිහිසුණු වුවත් සැබවින්ම සිදුවිය යුත්තේ එයම නොවේද? සැබෑම කතෝලිකයෙකුට එය ආනන්ද ජනක පුවතක් නොවේද? ක්‍රිස්තුස් වහන්සේට විඳින්නට සිදුවූ ඒ මහා දුක් ගාවිනාව උන්වහන්සේගේ අතීන්ද්‍රිය දේහය වන සභාවට මේ යුගයේ දී විඳින්නට සිදු වේ. යුගාන්තයේ සිදුවීම් ගැන ජේසු සමිඳුන්ගේ ශ්‍රාවකයන් එදා විමසූ විට උන්වහන්සේ පැවසූ දේ මතෙව් 24, මාක් 13, ලූක් 21 පරිච්ඡේදවල සටහන්ව ඇත. "බොරු දිවැසිවරු නැගිට බොහෝ දෙනා මුළා කරන්නාහ." (මතෙව් 24:11) එවැනි සලකුණු දිස් වන මෙම යුගයේ දී සුළඟින් ගසා ගෙන යන පරඬැල් මෙන් නොවී "බලාපොරොත්තුවේ වන්දනාකරුවන්" වෙමින් අග දක්වා ජේසු සමිඳුන්ම ආරම්භ කළ කතෝලික සභාව තුළ පවතින්නට අදිටන් කර ගනිමු.

**'දහම් නවෝදය' වෙබ් අඩවිය සකසා ඇත්තේ එහි සියල්ල ඉතා පහසුවෙන් බාගත කරගෙන ඒ සියල්ල පිටු වශයෙන් ලබා ගන්නට හැකි වන ආකාරයෙන් ය. එනිසා 'ශුද්ධාත්ම පිය සටහන්' 1 - 65 පරිච්ඡේද පිටු වශයෙන් ලබා ගෙන එය අධ්‍යයනය කරන්න.**

**http://dahamnavodaya.com**